# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1298/1 - 2003 ජූලි 21 වැනි සඳුදා - 2003.07.21

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී. බී. 4/96 II.

**1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ ධීවර හා සාගර සම්පත් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද විජේසේකර,
ධීවර හා සාගර සම්පත් අමාත්‍ය.

2003 ජූලි මස 11 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. මේ නියෝග 2003 හක් බෙල්ලන් පිළිබඳ ධීවර කළමනාකරණ සහ අපනයන නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. තත් කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබූ වලංගු ධීවර මෙහෙයුම් බලපත්‍රයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් හක් බෙල්ලන් ගැනීම, එකතු කිරීම, රැස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය.

03. සජීවී හෝ අජීවී හක් බෙල්ලන් ඇල්ලීමේ කාර්ය සඳහා කිසිම තැනැත්තෙකු විසින් මුහුදු පතුල හෑරීම, හෝ ට්‍රෝලර් මෙහෙයුම් වල යෙදීම නොකළ යුතු ය.

04. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් හක් බෙල්ලන් ඇල්ලීම තහනම් කරනු ලබන කාලසීමාවන් හෝ ප්‍රදේශ හෝ කාලසීමාවන් සහ ප්‍රදේශ ප්‍රකාශයට පත් කළ හැකි ය.

05. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක අධිකාරය යටතේ හැර කිසිම තැනැත්තෙකු විසින් හක් බෙල්ලන් සන්තකයේ තබා ගැනීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම හෝ ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

06. මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති පරිදි විෂ්කම්භය මි.මී. 70ට වඩා අඩු හක් බෙල්ලන් කිසිම තැනැත්තෙකු විසින් සන්තකයේ තබා ගැනීම, මිලදී ගැනීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම, ප්‍රවාහනය කිරීම හෝ අපනයනය කිරීම නොකළ යුතු ය.

07. (1) 5 වන නියෝගය යටතේ වූ අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලීමක්, මෙහි II උපලේඛනයේ නියම කර ඇති ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු අතර, රුපියල් 500.00 ක ගාස්තුවක් ද ඒ සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(2) මේ නියෝගය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක් ම මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු අතර, කලින් අවලංගු කරනු නොලැබුවහොත් නිකුත් කිරීමේ දින සිට මාස 6 ක කාලසීමාවක් සඳහා වලංගුව පවතී. නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් එහි නියම කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසි වලට යටත් විය යුතු ය.

1A-G 002926 - 1,500 (2003/07)

සැ. යු. —අති විශෙෂ ගැසට් අංක 1297/1 කාණ්ඩය අංක 1297/39න් අවසන් වේ.

08. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද අපනයන බලපත්‍රයක අධිකාරිය යටතේ හැර, කිසිම පුද්ගලයකු විසින් ශ්‍රී ලංකාවෙන් හක් බෙල්ලන් අපනයනය නොකළ යුතු ය.

09. (1) 8 වන නියෝගය යටතේ වන අපනයන බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් මෙහි IV වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු අතර, එය සමඟ රුපියල් 1,000.00ක ගාස්තුවක් ද තිබිය යුතුය.

(2) මේ නියෝග යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම මෙහි V වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු අතර, කලින් අවලංගු කරනු නොලැබුවහොත් එම බලපත්‍රය නිකුත් කිරීමේ දින සිට මාස 3 කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය. නිකුත් කරනු ලබන බලපත්‍රයක් එහි දක්වා ඇති නියම සහ කොන්දේසි වලට යටත් විය යුතු ය.

10. ආගමික සිද්ධස්ථානවල සන්තකයේ තබා ඇති හෝ කෞතුකාගාරවල සහ පාසැල් විද්‍යාගාරවල ප්‍රදර්ශනය කර ඇති හක් බෙල්ලන් පිළිබඳ මේ නියෝග ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

11. 2001 ජූනි මස 11 වන දින අංක 1188/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ මුහුදු බෙල්ලන් ධීවර කළමනාකරණ සහ අපනයන නියෝග මෙයින් ඉවත් කරනු ලැබේ.

12. *මේ නියෝගවල .–*


"හක් බෙල්ලා" යන්නෙන් "ටර්බිනෙල්ලා පයිරම්" වර්ගයට අයත් කවච අදහස් වන අතර, ඊට සජීවී හෝ අජීවී වුවද "ටර්බිනෙල්ලා පයිරම්" සම්පූර්ණ සත්වයා ද ඇතුළත් වේ.

"අධ්‍යක්ෂ ජනරාල්වරයා " යන්නෙන් 2000 අංක 4 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

"අපනයන" යන්නෙන් ශ්‍රී ලංකාවේ සීමාවලින් පිටත සමුද්‍රයට හෝ විදේශයකට ගෙන යාම අදහස් වේ.

## I වන උපලේඛනය

6 වන නියෝගය




හක් බෙල්ලා - ටර්බිනෙල්ලා පයිරම් (ලිනේයස් - 1758)

II වන උපලේඛනය

( 7 (I) වන නියෝගය )

හක් බෙල්ලන් සන්තකයේ තබා ගැනීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම හෝ
ප්‍රවාහනය සඳහා අවසර පත්‍රයක් සඳහා වන ඉල්ලුම් පත්‍රය

(මේ ඉල්ලුම්පත්‍රය රුපියල් පන්සියයක ගාස්තුවක් ද සමඟ යැවිය යුතුය)

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :
02. අ. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය :
    ආ. තැපැල් ලිපිනය :
03. ජාතික හැඳුනුම්පත් අංකය :
04. මිලදී ගන්නා ස්ථානය :

| ස්ථානය | ප්‍රමාණය |
|---|---|
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |

05. ප්‍රවාහන ක්‍රමය :

ඉහත ප්‍රකාශය මගේ උපරිම දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි. අවසර පත්‍රයේ දක්වා ඇති නියම හා කොන්දේසි වලින් සහ 2003 හක් බෙල්ලන් කළමනාකරණ හා අපනයන නියෝග වලින් ද මා බැඳී සිටිමි.

........................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :........................

III වන උපලේඛනය

(7(2) වන නියෝගය )

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

නව මහලේකම් කාර්යාලය
මාලිගාවත්ත,
කොළඹ 10
ශ්‍රී ලංකාව
අවසර පත්‍ර අංකය :........................

හක්බෙල්ලන් සන්තකයේ තබා ගැනීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම හෝ ප්‍රවාහනය සඳහා අවසර පත්‍රය

........................................................................හි පදිංචි........................................................................
........................................................................ට හක් බෙල්ලන් සන්තකයේ තබා ගැනීම, විකිණීම හෝ ප්‍රවාහනය සඳහා මෙයින් බලය ලබා දෙමි.

01. මේ අවසර පත්‍රය, කලින් අවලංගු කරනු නොලැබුවහොත් ........................................................ සිට ........................................................ දක්වා මාස 6ක කාලසීමාවකට වලංගු විය යුතුය.

02. මේ අවසර පත්‍රය පහත දැක්වෙන කොන්දේසිවලට යටත් විය යුතුය :

(I) මේ අවසර පත්‍රය මෙහි නම් කර ඇති තැනැත්තා විසින් භාවිතා කරනු ලැබිය යුතු අතර, එය වෙනත් යම් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතුය.
(II) මේ බලපත්‍රය, 2003 හක් බෙල්ලන් පිළිබඳ ධීවර කළමනාකරණ සහ අපනයන නියෝගවල විධි විධානවලට යටත් විය යුතුය.

දිනය :........................

........................................
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

IV වන උපලේඛනය

(9 (1) වන නියෝගය )

## හක් බෙල්ලන් අපනයනය කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය

(මේ ඉල්ලුම්පත්‍රය රුපියල් එක් දහසක් සමඟ ඉදිරිපත් කළ යුතුය.)

01. ඉල්ලුම්කරුගේ/ආයතනයේ සම්පූර්ණ නම :
02. ලිපිනය :
03. දුරකථන අංකය :
04. ෆැක්ස් අංකය :
05. භාණ්ඩ පිළිබඳ විස්තර :

| වාණිජ නම | ප්‍රමාණය (මි. මී.) | බර (කි. ග්‍රෑම්) | අල්ලා ගත්තේ කවර ස්ථානයක ද යන වග |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

06. අපනයනය කරන රට :

ඉහත ප්‍රකාශය සත්‍ය හා නිවැරදි බව මම/අපි සහතික කරමි./කරමු.

මෙහි ප්‍රකාශ කර ඇති විස්තර කිසිවක් වැරදි බව පෙනී ගියහොත්, ඒ විස්තර පදනම් කරගෙන නිකුත් කරන ලද මේ බලපත්‍රය අවලංගු කරනු ලැබීමට යටත් වන බවට මම/අපි එකඟ වෙමි/වෙමු.

දිනය :.......................

.......................
ඉල්ලුම්කරුගේ අත්සන.

V වන උපලේඛනය

(9 (2) වන නියෝගය)

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

නව මහලේකම් කාර්යාලය
මාලිගාවත්ත,
කොළඹ 10,
ශ්‍රී ලංකාව,
බලපත්‍ර අංකය :.........................

## හක් බෙල්ලන් අපනයන කිරීම සඳහා බලපත්‍රය

I ....................................................................................හි පදිංචි ....................................................................
....................................................................................ට පහත දැක්වෙන හක් බෙල්ලන් ප්‍රමාණය අපනයනය කිරීමට බලය දෙමි.

සංඛ්‍යාව සහ බර

........................................................................
........................................................................
........................................................................

2 මේ බලපත්‍රය, කලින් අවලංගු කරනු නොලැබුවහොත් ........................................ දක්වා කාලසීමාවකට වලංගු විය යුතුය.

3. මේ බලපත්‍රය පහත දැක්වෙන නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(I) ..........................................................
(II) ..........................................................

දිනය :........................

..........................................
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

08-326

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2 -G 002926